# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2123/3 - 2019 මැයි මස 13 වැනි සඳුදා - 2019.05.13**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 11/1979 (iii)

**1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සමග කියවිය යුතු 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 27 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2019 මැයි මස 13 වන දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2019 අංක 1 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (අන්තවාදී සංවිධාන තහනම් කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

1A - G 29759 — 382 (2019/05)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. රට තුළ සාමය අඛණ්ඩව පවත්වාගෙන යාම තහවුරු කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකා රජය විසින් සද්භාවයෙන් දරන ලද ප්‍රයත්නයන් වැඩි දියුණු කර ගැනීමේ අරමුණින් සහ ජාතික ආරක්ෂාව, මහජන සාමය සහ නීතියේ ආධිපත්‍යයේ හිතසුව පිණිස මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් සංවිධාන මෙයින් තහනම් කරනු ලැබේ.

3. ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී, කිසිම තැනැත්තකු විසින්, මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් සංවිධානයක හෝ ඒ සංවිධානය නියෝජනය කරන හෝ ඒ වෙනුවෙන් ක්‍රියා කරන නැතහොත් ඒ හා සම්බන්ධ හෝ ඒ කෙරෙහි සැලකිල්ලක් දක්වන වෙනත් යම් සංවිධානයක හෝ ඉහත නිශ්චිතව සඳහන් ක්‍රියාකාරකම් කිසිවක් හා සම්බන්ධ බවට හෝ ඒ කෙරෙහි සැලකිල්ලක් දක්වන බවට සාධාරණ සැකයක් පවතින වෙනත් යම් සංවිධානයක -

(අ) සාමාජිකයකු හෝ සමූහයක සාමාජිකයකු වීම;

(ආ) නායකත්වය සැපයීම;

(ඇ) නිල ඇඳුම්, ඇඳුම්, සංකේත, ලාංඡන හෝ ධජ පැළඳීම, ප්‍රදර්ශනය කිරීම, එසැවීම හෝ සන්තකයේ තබා ගැනීම;

(ඈ) රැස්වීමක් කැඳවීම, රැස් කිරීම, පැවැත්වීම හෝ ඊට සහභාගී වීම;

(ඉ) සාමාජිකත්වය ලබා ගැනීම හෝ බැඳීම;

(ඊ) සාමාජිකයකුට හෝ සමූහයකට හෝ එහි වෙනත් යම් ආශ්‍රිතයකුට රැකවරණය සැලසීම, ඔහු සඟවා තබා ගැනීම, ඔහුට ආධාර කිරීම;

(උ) එය ප්‍රවර්ධනය කිරීම, දිරි ගැන්වීම, සහාය දැක්වීම, උපදෙස් දීම, ආධාර කිරීම හෝ ඒ වෙනුවෙන් ක්‍රියා කිරීම;

(ඌ) එහි යම් ක්‍රියාකාරකමක් හෝ වැඩසටහනක් සංවිධානය කිරීම හෝ ඊට සහභාගී වීම;

(එ) මුදල් හෝ ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම හෝ මුදලින් හෝ ද්‍රව්‍යවලින් දායක වීම;

(ඒ) ඒ සඳහා හෝ එහි ද්‍රව්‍ය ප්‍රසම්පාදනය, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, සන්තකයේ තබා ගැනීම හෝ බෙදා හැරීම;

(ඔ) අරමුණු සඳහා සහාය දීම හෝ නියෝජනය කිරීම;

(ඕ) යම් ගනුදෙනුවක නිරත වීම; හෝ

(ක) ඒ වෙනුවෙන් තොරතුරු පතුරුවා හැරීමට සැලැස්වීම,

නොකළ යුතු ය.

4. මේ නියෝගවල 3 වන නියෝගය උල්ලංඝනය කරමින් ක්‍රියා කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, කොළඹදී පවත්වනු ලබන්නා වූ ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද්දා වූ ද, බස්නාහිර පළාතේ මහාධිකරණය මගින් වරදකරු කරනු ලැබීමේ දී, අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයකට යටත් විය යුතු ය.

5. මේ නියෝගවල 3 වන නියෝගය උල්ලංඝනය කරමින් වරදක් සිදු කිරීමට කුමන්ත්‍රණය කරන, ඒ සඳහා තැත් කරන, අනුබල දෙන, හෝ වරදක් සිදු කිරීම සඳහා සූදානම් වීම පිණිස යම් ක්‍රියාවක් කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, කොළඹ දී පවත්වනු ලබන්නා වූ ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද්දා වූ ද, බස්නාහිර පළාතේ මහාධිකරණය මගින් වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු දහයක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයකට යටත් විය යුතු ය.

6. යම් පුද්ගල මණ්ඩලයක් විසින් මේ නියෝග යටතේ වරදක් සිදු කරනු ලබන අවස්ථාවක දී, එම වරද සිදු කිරීම පිළිබඳව සෘජුවම වගකියනු ලැබිය යුතු තැනැත්තන්ට අමතරව -

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකුම සහ ප්‍රධාන විධායක නිලධරයා;

(ආ) ඒ පුද්ගල මණ්ඩලය හවුල් ව්‍යාපාරයක් නම්, ඒ හවුල් ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකුම සහ ප්‍රධාන විධායක නිලධරයා; සහ

(ඇ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නොවන සංස්ථාගත කරනු නොලැබූ මණ්ඩලයක් නම්, ඒ පුද්ගල මණ්ඩලයේ, කණ්ඩායමේ හෝ සංවිධානයේ නායකයා සහ ඒ මණ්ඩලයේ, කණ්ඩායමේ හෝ සංවිධානයේ කළමනාකරණය සහ පාලනය සඳහා වගකිව යුතු සෑම නිලධරයකුම,

ඒ පුද්ගල මණ්ඩලයට අතිරේකව, ඒ වරදට වරදකරු වන බවට සලකනු ලැබිය යුතු ය.

7. (1) ජනාධිපතිවරයා විසින් යෝග්‍ය යයි ඔහු විසින් සලකනු ලබන යම් පරීක්ෂණයකින් පසු මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් තහනම් කරනු ලැබූ සංවිධානවල කාර්යය සඳහා භාවිත කරනු ලබන හෝ භාවිත කිරීමට අදහස් කරනු ලබන යම් මුදල්, සුරැකුම් හෝ බැරකම් යම් තැනැත්තකුගේ භාරයේ පවත්නා බවට සෑහීමට පත් වන අවස්ථාවක දී ජනාධිපතිවරයා විසින් ලිඛිත නියමයක් මගින් ඒ යම් තැනැත්තාගේ භාරයේ පවතින මුදල්, සුරැකුම් හෝ බැරකම් හෝ ඒ නියමය කිරීමෙන් පසු ඒ තැනැත්තාගේ භාරයට පත්වන යම් මුදල්, සුරැකුම් හෝ බැරකම් සහ ඒ සංවිධානවලට අයත් වෙනත් යම් චංචල හෝ නිශ්චල දේපළ රාජසන්තක විය යුතු බවට ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන ඡේදය යටතේ ජනාධිපතිවරයා විසින් කරනු ලබන නියමය අවසානාත්මක සහ තීරණාත්මක විය යුතු අතර, රිට් ආඥාවක් මගින් හෝ වෙනත් යම් ආකාරයකින් කිසිම අධිකරණයක දී ප්‍රශ්න කිරීම සඳහා කැඳවනු නොලැබිය යුතු ය.

8. මානුෂීය ආධාර සැපයීම හා සම්බන්ධ යම් ක්‍රියාකාරකමක යෙදීම සඳහා රාජ්‍ය ආරක්ෂාව විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කලින් කල ලිඛිත නියමයක් මගින් නිශ්චිතව දක්වනු ලබන සහ ශ්‍රී ලංකා රජය සමග ගිවිසුමකට එළඹී සිටින ජාත්‍යන්තර සංවිධානයක අයිතිවාසිකම්වලට මේ නියෝගවල විධිවිධාන කිසිම ආකාරයකින් බලනොපෑ යුතු බවට සැක දුරු කිරීමේ කාර්යය සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

### උපලේඛනය

[2 වන නියෝගය]

1. ජාතික තව්හිද් ජමාත් සංවිධානය (NTJ)
2. ජමාතේ මිලාතේ ඊබ්‍රාහීම් (JMI)
3. විලයාත් අස් සෙයිලානි